# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## ඉතිහාසය

| | | |
|---|---|---|
| | | විභාග අංකය:.......................................... |
| 10 ශ්‍රේණිය | I කොටස | කාලය පැය 1 |

සැලකිය යුතුය
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1),(2) (3) (4) පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න. එම අංකය මත X ලකුණ යොදන්න.

(01) මහාවංසය ඉතිහාසය ඉගෙනීමේදී සුවිශේෂ වන්නේ,
(1) පැරණිතම වංසකතාව වීම නිසාය.
(2) අඩංගු තොරතුරු වල විශ්වාසනීය බව නිසාය.
(3) සමකාලීන තොරතුරු රචනාවීම නිසාය
(4) දේශපාලන හා ආගමික තොරතුරු අඛණ්ඩව ඇතුළත්වීම නිසාය

(02) පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකතා ලියවී ඇත්තේ,
(1) පුස්කොළ පොත්වලය (2) කටාරම් වලය
(3) ගල් පුවරු මතය (4) සාහිත්‍ය මූලාශ්‍ර වලය

(03) ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස ශිලා ලිපි සම්බන්ධයෙන් අදාල නොවන ප්‍රකාශය තෝරන්න.
(1) ශිලාලිපි සිද්ධීන්ට සමකාලීන වීම
(2) සිංහල අක්ෂර මාලාවේ විකාශනය දැනගත හැකි වීම.
(3) අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගැනීමට උපකාරී වීම.
(4) වංසකතා වල ඇති තොරතුරු තහවුරු කර ගැනීමට හැකිවීම.

(04) ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමේදී සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය වැනි මූලාශ්‍ර වැදගත් වන්නේ,
(1) අනුරාධපුර සිට පොළොන්නරු අවධිය දක්වා
(2) දඹදෙණි අවධියේ සිට ගම්පොල අවධිය දක්වා
(3) ගම්පොල සිට කෝට්ටේ අවධිය දක්වා
(4) කෝට්ටේ අවධියේ සිට මහනුවර අවධිය දක්වා

(05) ලෙන් ලිපි හෙවත් කටාරම් ලිපි වල වැඩි වශයෙන් දැක්වෙන්නේ,
(1) රජවරුන්ගේ දේශපාලන සේවය (2) ඉඩම් ප්‍රදානය පිළිබඳව ය.
(3) ලෙන් පිදූ පුද්ගලයින් පිළිබඳව ය. (4) රාජ ආඥා පිළිබඳව ය.

(06) ශිලාලිපි වල හිරු සඳු සංකේතයෙන් දක්වා ඇත්තේ,
(1) සෞභාග්‍යය (2) ස්ථිරත්වය
(3) රාජ්‍යයේ බලය (4) පූර්ණත්වය

(07) ප්‍රාග් ඓතිහාසිත යුගයේ තාක්ෂණය පිළිබඳ තොරතුරු දැනගැනීමට ඇති ප්‍රධාන සාධකය වූයේ,
(1) යකඩ ලෝහය (2) නිවාස ඉදිකිරීම
(3) ගල් මෙවලම් භාවිතය (4) මැටි වළං ය.

(08) ආදි මානවයා ජීවත්වූ වඩාත් පැරණිම ස්ථානය වන්නේ,
(1) පාහියන්ගල හා කුරුවිට බටදොඹලෙන ය.
(2) කිතුල්ගල බෙලිලෙන හා පාහියන්ගල ය.
(3) කුරුවිට බටදොඹලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස ය.
(4) අත්තනගොඩ අළුලෙන හා පොම්පරිප්පු ය.

(09) දාර මට්ටම් කොට, හිස්කබල දෙකට බෙදා රතු ගුරුගල් ආලේප කරන ලද හිස්කබලක් හමුවී ඇත්තේ,
(1) රාවණා ඇල්ලෙනි. (2) කුරුවිට බටදොඹලෙනෙනි.
(3) මානියම්ගමිනි. (4) මිනිහාගල්කන්දෙනි.

(10) කලපු බෙල්ලන් හා ලුණු භාවිතාව සිදුවූ බවට තොරතුරු අනාවරණය වන ස්ථානය වන්නේ,
(1) කුරුවිට බටදොඹලෙන (2) පාහියන්ගල ලෙන
(3) කිතුල්ගල බෙලිලෙන (4) බූන්දල

(11) සාමාන්‍ය මැටි බඳුනක භෂ්මාවශේෂ තැන්පත් කොට පොළවේ වළලා තිබූ සුසාන ක්‍රමය හැඳින්වෙන්නේ,
(1) ශිලා මංජුසා සොහොන් (2) කුම්භීය නිඛනන සුසාන
(3) මහාශිලා සුසාන (4) මැටිඔරු සුසාන

(12) මුල් යුගයේ ජනතාව ගංගා නිම්න වලින් පිටත ප්‍රදේශ පදිංචිය සඳහා තෝරා ගැනීමට හේතුව කුමක්ද?
(1) කෘෂිකර්මාන්තයට හිතකර වීම (2) ගංවතුර උවදුරින් බේරීම
(3) වන සතුන්ගෙන් ආරක්ෂා වීම (4) ගමනාගමන පහසුව

(13) අත්හැරදැමූ වැව් ගම් හැඳින්වූ නම කුමක්ද?
(1) ඕල ගම් (2) නියම්ගම්
(3) පරික්ඛීත ගම් (4) පිටගම්

(14) බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න, බෙල්ලන්බැඳිපැලැස්ස යන වාසස්ථාන වැදගත් වන්නේ ඒවා,
(1) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා ජීවත්වූ ස්ථාන නිසා ය.
(2) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ ලෙන් වාසස්ථාන නිසා ය.
(3) මුල් ඓතිහාසික යුගයේ වාපිගම් පිහිටි ස්ථාන නිසා ය.
(4) ආදි මානවයා ජීවත්වූ එළිමහන් වාසස්ථාන නිසා ය.

(15) වංසකතා හා සෙල්ලිපි වල "පට්ටානගාම" යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) වැව් ගමය (2) වෙළඳ ගමය
(3) වරාය ආශ්‍රිත ගමය (4) ධීවරයින් විසූ ගම් ය.

(16) ප්‍රාදේශීය පාලන කටයුතු කළ පරුමකවරුන් "පොවනි රජ" යනුවෙන් හඳුන්වා ඇති සෙල්ලිපිය කුමක්ද?
(1) කොත්ගල්කන්ද ලිපිය (2) යටහලෙන ලිපිය
(3) වේවැල්කැටිය ලිපිය (4) ඇඹුල් අඹේ ලිපිය

(17) සංවිධානාත්මකව සටන් ව්‍යාපාරයක් මෙහෙයවීම.
මාතොට අන්තර්ජාතික වරාය විදේශාධිපත්‍යයෙන් මුදා ගැනීම.
ප්‍රතිමල්ලවයන්ගේ සොහොනට නිසි ගෞරව දැක්වීම
ඉහත තොරතුරු හා සම්බන්ධ රජතුමා වන්නේ,
(1) වසභ රජු (2) දුටුගැමුණු රජු
(3) දේවානම්පියතිස්ස රජු (4) I වන විජයබාහු රජු

(18) පුරාණ කාලයේ රටේ නීති සම්පාදනය වූයේ
(1) අධිකරණයෙනි (2) රාජ සභාවෙනි
(3) ව්‍යවස්ථාදායකයෙනි (4) විධායකයෙනි

(19) පහත සඳහන් 'අ' හා 'ආ' තීර නිවැරදිව ගැළපා ඇති පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. පන අදෙක | A ඇතුන් භාර නිළධාරියා |
| 2. හති අදෙක | B භෝජනශාලා අධිකාරී |
| 3. බතඟ | C වෙළඳ කටයුතුභාර ප්‍රධානියා |
| 4. කනපෙඩික | D ලේඛනාගාර ප්‍රධානියා |

(1) ADBC (2) BACD
(3) DABC (4) CABD

(20) රජු බලයට පත්වී දසවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම හා සම්බන්ධ රජතුමා වන්නේ,

(1) වසභ රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා
(3) දුටුගැමුණු රජතුමා (4) දේවානම්පියතිස්ස රජතුමා

(21) වසභ රජතුමා යාපන ප්‍රදේශය පාලනය සඳහා ඉසිගිරි ඇමතිවරයා පත්කර සිටි බව සඳහන් වන අභිලේඛනය වන්නේ,

(1) පනාකඩුව තඹ සන්නස (2) වල්ලිපුරම් සන්නස
(3) ගල්පොත සෙල්ලිපිය (4) බදුලු ටැම් ලිපිය

(22) පළවන විජයබාහු රජතුමා ශ්‍රී ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු වීමට ප්‍රධානතම හේතුව,

(1) භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමයි
(2) චෝළ පාලනයෙන් රට නිදහස් කරගැනීමයි
(3) බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
(4) කෘෂිකර්මාන්තයේ දියුණුවට පැරණි වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කිරීම

(23) පහත සඳහන් 'අ' හා 'ආ' තීරු නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ගජබාහු රජු | A රෝමයට දූත පිරිස් රැගෙන යාම |
| 2. භාතිකාභය රජු | B ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම |
| 3. VI අග්බෝ රජු | C විසි වතාවක් චීනයට දූත ගමන් යාම |

(1) BAC (2) ABC
(3) ACB (4) CAB

(24) අතීතයේ සිටම ශ්‍රී ලංකාව අන්තර්ජාතික වෙළඳ කටයුතු වලදී වඩාත් වැදගත් වීමට හේතු වූයේ,

(1) කුඩා දූපතක් වීම (2) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
(3) ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම (4) ලංකාව වටා වරායන් තිබීම

(25) නානාදේසීන්, වලඤ්ජියාර් හා අයින්නූරුවරු යනු,

(1) අතීතයේ සිට අපේ රටේ සිටි වෙළඳ පිරිසකි
(2) උතුරු ඉන්දියානු වෙළඳ සංවිධාන කීපයකි.
(3) පර්සියානු වෙළඳුන් පිරිසකි.
(4) දකුණු ඉන්දියානු වෙළඳ සංවිධාන කීපයකි.

(26) වෙජ්ජසාලා යනු කුමක්ද?

(1) ආරෝග්‍යශාලා ය (2) හින්දු ආගමික ස්ථානයන් ය.
(3) අධ්‍යාපන ආයතනයන් ය. (4) වෙළඳ සංවිධානයන් ය.

(27) හේන් වගාකිරීම වෙනුවෙන් රජයට අය කරගත් බද්ද හැඳින්වූයේ ,

(1) බොජකපති (2) දකපති
(3) කැතිඅඩ (4) මතෙරමජිබක

(28) ශ්‍රී ලංකාවේ ආහාරය සඳහා බහුලව භාවිතා වන ධාන්‍ය වර්ගය මින් කුමක්ද?
- (1) තිරිඟු
- (2) කව්පි
- (3) බඩඉරිඟු
- (4) වී

(29) කෝණේශ්වරම් කෝවිල දක්නට ලැබෙන්නේ කවර වරාය ආශ්‍රිතවද?
- (1) ගෝකණ්ණ වරාය
- (2) දඹකොළපටුන වරාය
- (3) මාතොට වරාය
- (4) දෙවුන්දර වරාය

(30) ශ්‍රී ලංකාව "රතුකැට දිවයින" යනුවෙන් හැඳින්වූ ඉතිහාසඥයා කවුද?
- (1) මෙගස්තීනස්
- (2) ඉබන් බතූතා
- (3) අල්බලසූරි
- (4) ප්ලිනි

(31) මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස්කර තැනූ ප්‍රසිද්ධ ඇළ මාර්ගය වූයේ,
- (1) මිණිපේ ඇළ
- (2) යෝධ ඇළ
- (3) ජය ගඟ
- (4) ඇළහැර ඇළ

(32) තැනිතලා බිමක කෘතිමව සාදන ලද චාපාකාර වැව් බැම්මක් සහිත වැවකට හොඳම නිදසුන වන්නේ මින් කුමක්ද?
- (1) යෝධ වැව
- (2) මින්නේරි වැව
- (3) කලා වැව
- (4) පදවිය වැව

(33) නූතන කොංක්‍රීට් තාක්ෂණයට සමානව ක්‍රමවේදයක් අනුගමනය කරමින් අත්තිවාරම් සකස්කර තිබෙන ස්තූපයට හොඳම නිදසුන වන්නේ,
- (1) ථූපාරාමය
- (2) අභයගිරිය
- (3) රුවන්වැලිසෑය
- (4) ජේතවනාරාමය

(34) සෙල්ලිපි හා වෙනත් මූලාශ්‍ර වල සඳහන් වන පරිදි බෞද්ධ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ නම් කීපයක් 'අ' තීරුවේද ඊට සුදුසු අර්ථයන් 'ආ' තීරුවේද දක්වා ඇත. එය නිවැරදිව ගැළපූ විට පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| (1) ථෙර | A නායක තෙරුන්වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා |
| (2) අන්තේවාසික | B නායක ස්වාමීන්වහන්සේලා |
| (3) සද්ධිවිහරිය | C ධර්මයේ කොටස් කටපාඩමින් මතක තබාගත් භික්ෂූන්වහන්සේලා |
| (4) භාණකවරු | D නායක ස්වාමීන් වහන්සේලා යටතේ වැඩ වාසය කළ භික්ෂූන්වහන්සේලා |

- (1) BDAC
- (2) BADC
- (3) BCAD
- (4) DABC

(35) මල් කැටයම් 21 කින් යුක්ත වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමුවී ඇති ස්ථානය
- (1) ජේතවනාරාමය
- (2) අභයගිරිය
- (3) මහාවිහාරය
- (4) රුවන්වැලිසෑය

(36) වැවක වැව් බැම්ම ගිලා නොබැසීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගයක් වූයේ මින් කුමක්ද?
- (1) පිහිටි ගලක් තෝරා ඒ මත වැව් බැම්ම ඉදි කිරීම
- (2) ශක්තිමත් කළුගලින් වැව් බැම්ම ඉදි කිරීම
- (3) වාන් දොරටු මගින් වැඩි ජලය පිට කිරීම
- (4) බිසෝ කොටුව ශක්තිමත්ව ඉදි කිරීම

(37) පානීය ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කර ගැනීම සඳහා ඉදි කරන ලද නිර්මාණය කුමක්ද?
- (1) පොකුණු
- (2) අමුණු
- (3) සීතල ළිං
- (4) ඌරාකැට ළිං

(38) ගෘහ දණ්ඩ බද්ද යනු,

(1) සැඟවී සිටින අපරාධකරුවන් අල්ලා දෙන තුරු ගම්වැසියන් ගෙන් අයකරනු ලබන බද්දකි

(2) වැව් ජලය භාවිතා කරන්නන්ගේ අයකළ බද්දකි

(3) රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් රජයට ගෙවිය යුතු බද්දකි

(4) ඇළමාර්ග වල මසුන් ඇල්ලීම වෙනුවෙන් රජයට ගෙවියයුතු බද්දකි.

(39) අතීත සමාජ ධූරාවලියට අනුව සමාජයේ පහළම මට්ටමේ සිටි පිරිස හඳුන්වා ඇත්තේ

(1) කුඩීන් (2) ප්‍රභූන්

(3) දාසයින් (4) කම්කරුවන්

(40) උස්බිම් වල වනාන්තර කැපීම නොකළයුතු බවට නීති පැනවීමෙන් අතීත රජවරු බලාපොරොත්තුවූයේ,

(1) ජල උල්පත් සිඳීයාම වළක්වා ගැනීම

(2) වන සතුන්ගේ වාසස්ථාන අහිමි වීම.

(3) වගා බිම් වල පස නිසරු වීම.

(4) වැව් වලට රොන් මඩ එකතුවීම වළක්වා ලීම.